# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 41 දරන
# බිමත්ව කරන ලද වැරදි පිළිබඳ
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක

මිල: ශත 65 යි    තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1979 අංක 41 දරන බීමත්ව කරන ලද වැරදි පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 123/78

බීමත්ව සිටිය දී සිදු කරන ලද ඇතැම් වැරදි සම්බන්ධයෙන් වැඩි දඬුවමක් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 41 දරන බීමත්ව කරන ලද වැරදි පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බීමත්ව සිටිය දී කරදර සිදුකිරීම.

2. යම් ප්‍රසිද්ධ ස්ථානයක දී හෝ යම් ස්ථානයකට තමාගේ ඇතුළුවීම අයුතු ලෙස ඇතුළුවීමක් වන අවස්ථාවක එවැනි ස්ථානයක දී හෝ බීමත්ව සිටිය දී යම් තැනැත්තකුට කරදරයක් සිදුවන පරිදි හැසිරෙන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

බීමත්ව සිටිය දී පොදු දේපළවලට හානි කිරීම.

3. බීමත්ව සිටිමින් පොදු දේපළවලට අලාභහානි සිදු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට මාස හයකට නොඅඩු වූ ද අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය. තව ද රුපියල් එක් දහසකට නොඅඩු වූ ද රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන්නා වූ ද දඩයකට ඔහු යටත් විය යුතු ය.

වයස අවුරුදු දොළහට අඩු දරුවකුට මත්පැන් දීම.

4. යථා පරිදි සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයකුගේ නියමය පරිදි හෝ අසනීපයක් තිබෙන නැතහොත් අසනීපයක් වෙතැයි බලාපොරොත්තු වන අවස්ථාවක දී හෝ හැර, වයස අවුරුදු දොළහට අඩු යම් දරුවකුට මත්පැන් කිසිවක් දෙන්නා වූ හෝ දීමට සලසන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තන්ට මත්පැන් විකිණීම.

5. (1) වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකුට මත්පැන් කිසිවක් විකුණන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට හය මසකට නොඅඩු වූ ද, අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය. තව ද රුපියල් එක් දහසකට නොඅඩු වූ ද රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන්නා වූ ද, දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) යම් මංමාවතක දී නැතහොත් පොදු ස්ථානයක දී මත්පැන් කිසිවක් පානය කරමින් සිටින විට යම් සාම නිලධරයකුට අසුවන වයස අවුරුදු දහ අටකට අඩු යම් තැනැත්තකු සන්තකයෙහි තිබෙන මත්පැන්, ඒ සාම නිලධරයා විසින් තහනමට ගනු ලැබිය හැකි අතර, එසේ තහනමට ගන්නා ලද මත්පැන් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි යම් ආකාරයකට බැහැර කරනු ලැබිය යුතු ය.

2—ඒ 41911—13,450 (79/05)

වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගැනීම.

6. යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද යම් සාම නිලධරයකුගේ මතය අනුව බීමත්ව සිටින්නා වූ ද, මේ පනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ හෝ මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ ඒ විධිවිධාන යටතේ හෝ යම් වරදක් කරන්නා වූ ද යම් තැනැත්තකු ඒ සාම නිලධරයා විසින් වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර ඒ සිරභාරයට ගැනීම සිදු කිරීමේ දී අවස්ථානුකූලව සාධාරණ විය හැකි යම් බලයක් වේ ද ඒ බලය පාවිච්චි කරනු ලැබිය හැකි ය.

වෛද්‍ය වෘත්තිකයකු විසින් පරීක්ෂා කිරීම.

7. මේ පනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ වූ හෝ මෙහි උපලේඛනයේ I වන තීරයේ සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ ඒ විධිවිධාන යටතේ වූ හෝ වරදක් සඳහා සාම නිලධරයකු විසින් යම් තැනැත්තකු සිර භාරයට ගත් අවස්ථාවක—

(අ) ඒ තැනැත්තා බීමත්ව සිටී ද යන වග නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා වෛද්‍ය වෘත්තිකයකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කරවීම අවශ්‍ය යයි ඔහු කල්පනා කරන්නේ නම් හැකි තාක් ඉක්මණින් ඒ තැනැත්තා ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු ලවා පරීක්ෂා කරවීමට සැලැස්විය හැකි ය. එසේ කරන ලද යම් පරීක්ෂා කිරීමක ප්‍රතිඵලය ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයා විසින් නොපමාව ඒ සාම නිලධරයාට වාර්තා කළ යුතු ය.

(ආ) ප්‍රශ්වාස විශ්ලේෂණ පරීක්ෂණයක් කිරීම අවශ්‍ය බව ඒ සාම නිලධරයා අදහස් කරන්නේ නම් ද ඒ පරීක්ෂණය කිරීමට අවශ්‍ය පහසුකම් ඇත් නම් ද ඒ පරීක්ෂණයට වහාම භාජන වීමට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

අනුමත ඔපරේටර්වරයකු විසින් ප්‍රශ්වාස විශ්ලේෂණ පරීක්ෂණය කළ යුතු බව.

8. 7 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ප්‍රශ්වාස විශ්ලේෂණ පරීක්ෂණය, නියම කරනු ලැබිය හැකි ඒ නියෝගවලට අනුකූලව, අනුමත ඔපරේටර්වරයකු විසින් කළ යුතු ය.

පරීක්ෂා කරනු ලැබීම ප්‍රතික්ෂේප කිරීම සඳහා දඬුවම.

9. 7 වන වගන්තිය යටතේ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු විසින් හෝ අනුමත ඔපරේටර්වරයකු විසින් කරනු ලබන පරීක්ෂණයකට භාජන වීමට නියම කරනු ලැබූ විට එසේ පරීක්ෂණයට භාජන වීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ ඒ වගන්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කරන සාම නිලධරයකුට බාධා කරන්නා වූ නැතහොත් ප්‍රතිරෝධය දක්වන්නා වූ හෝ යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන් සියයක් නො ඉක්ම වන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ඇතැම් වැරදි සම්බන්ධයෙන් දඬුවම වැඩි කිරීම.

**10.** දණ්ඩ නීති සංග්‍රහයෙහි කුමක් සඳහන් ව ඇත ද මෙහි උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති වරදකට යම් තැනැත්තකු වරදකරු කරන සෑම මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් ම, ඒ අධිකරණයේ දඬුවම් කිරීමේ සාමාන්‍ය බලතල කුමක් වුව ද, බිමත්ව සිටිය දී ඒ තැනැත්තා විසින් ඒ වරද කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති දඬුවම ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

යම් තැනැත්තකු වෙතින් මත් පැන් ආදී ගඳ වහනය වන්නේ නම් ඔහු බිමත්ව සිටින බවට පූර්ව නිගමනය කළ යුතු බව.

**11.** (1) ක්‍රියාව කරන වේලාවේ දී හෝ ඒ ආසන්න වේලාවක දී ප්‍රස්තුත තැනැත්තා වෙතින් මත් පැන් ගඳ වහනය වන්නේ නම් හෝ ඔහු මත් පැන් පානය කර ඇති බව අනුමාන කිරීම සාධාරණ විය හැකි ආකාරයකින් ඔහු හැසිරෙයි නම්, පටහැනි සාක්ෂි ඉදිරිපත් කර ඇත් නම් මිස, ඒ තැනැත්තා බිමත්ව සිටින බව පූර්ව නිගමනය කළ යුතු ය.

(2) යම් තැනැත්තකු බීමත්ව සිටින බවට වූ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ වාර්තාව හෝ යම් තැනැත්තකුගේ රුධිරයේ ඇති මද්‍යසාර සාන්ද්‍රණය නියමිත සීමාවට සමානව පවතින බවට නැතහොත් එය ඉක්මවන බවට වූ අනුමත ඔපරේටර්වරයකුගේ වාර්තාව, පටහැනි සාක්ෂි ඉදිරිපත් කර ඇත් නම් මිස, එහි ඇතුළත් සිද්ධි සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි ලෙස සලකනු ලැබිය යුතු ය.

සියලු වැරදි මහෙස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කරනු ලැබිය හැකි බව.

**12.** (1) මේ පනත යටතේ වූ සියලු වැරදි විභාග කිරීමට මහෙස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(2) මේ පනතේ 2 වන හෝ 4 වන වගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම නඩු විභාග කර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොඅඩු වූ ද රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ අවුරුදු එකකට නොඅඩු වූ ද අවුරුදු දෙකක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට, ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම ඒ අධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවන්නේ වුව ද යටත් විය යුතු ය.

නියෝග.

**13.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා සහ, විශේෂයෙන් ම, පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය :—

(අ) නියම කිරීමට මේ පනතින් නියමිතව ඇති සියලු කාරණා ;

(ආ) යම් ප්‍රශ්වාස විශ්ලේෂණ පරීක්ෂණයක් කරන ක්‍රමය හා ආකාරය සහ ඒ සඳහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා ; සහ

(ඇ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු බීමත්ව සිටින ලෙස සලකනු ලැබිය යුත්තේ ඒ තැනැත්තාගේ රුධිරයෙහි යම් ප්‍රමාණයක හෝ යම් ප්‍රමාණයක් ඉක්මවන මද්‍යසාර සාන්ද්‍රණයක් තිබුණහොත් ද ඒ ප්‍රමාණය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතුය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුත්තේ කවර දිනයක සිට ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අනුමත ඔපරේටර්වරයා" යන්නෙන් ප්‍රශ්වාස විශ්ලේෂණ උපකරණ ක්‍රියා කරවීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලැබූ ද පොලිස්පතිවරයා විසින් ඒ වෙනුවෙන් පත් කරනු ලැබූ ද සාම නිලධරයෙක් අදහස් වේ;

"ප්‍රශ්වාස විශ්ලේෂණ පරීක්ෂණය" යන්නෙන් අනුමත ප්‍රශ්වාස විශ්ලේෂණ උපකරණයක ආධාරයෙන් මේ පනතේ කාර්ය සඳහා තැනැත්තකුගේ ප්‍රශ්වාස වාතයේ සැම්පලයක් විශ්ලේෂණය කිරීමක් අදහස් වේ;

"ප්‍රශ්වාස විශ්ලේෂණ උපකරණය" යන්නෙන් නියම කරනු ලැබිය හැකි වර්ගයක උපකරණයක් අදහස් වේ;

"මත්පැන්" යන්නට ස්ප්‍රීතු, වයින්, රා, බීර සහ මද්‍යසාරයෙන් සමන්විත හෝ මද්‍යසාර අඩංගු සියලු ද්‍රව ද ඇතුළත් වේ;

"සාම නිලධරයා" යන්නෙහි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"පොදු දේපළ" යන්නෙන් රජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් දේපළක් අදහස් වේ.

## උපලේඛනය

| I වන තීරුව<br>ප්‍රඥප්තිය සහ වගන්ති | II වන තීරුව<br>දඩුවම් |
|---|---|
| 1. දණ්ඩ නීති සංග්‍රහය—183 වන වගන්තිය ... | මාස තුනකට දක්වා වූ කාලයකට දීර්ඝ විය හැකි වූ බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් තුන්සියය දක්වා දීර්ඝ විය හැකි වූ දඩය හෝ ඒ දඩුවම් දෙකම. |
| 2. දණ්ඩ නීති සංග්‍රහය—186 වන වගන්තිය ... | අවුරුදු හතරක් දක්වා වූ කාලයකට දීර්ඝ විය හැකි වූ බන්ධනාගාරගත කිරීම. |
| 3. දණ්ඩ නීති සංග්‍රහය—298 වන වගන්තිය ... | අවුරුදු පහක් දක්වා වූ කාලයකට දීර්ඝ විය හැකි වූ බන්ධනාගාරගත කිරීම. |
| 4. දණ්ඩ නීති සංග්‍රහය—314 වන වගන්තිය ... | අවුරුද්ද එකක් දක්වා වූ කාලයකට දීර්ඝ විය හැකි වූ බන්ධනාගාරගත කිරීම. |